www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# මුෂාරෆ් ලාල් මස්ජිඩ් ඝාතනය පසසයි

## Musharraf lauds Lal Masjid massacre

**කීත් ජෝන්ස් විසිනි**

**2007 ජුලි 13**

පසුගිය බ්‍රහස්පතින්දා කල ජාතික රූපවාහිනී කතාවකදී පකිස්තානයේ ඇමරිකානු පිටුබලය ලබන ඒකාධිපති පාලකයා වන ජනරාල් පර්වස් මුෂාරෆ්, පකිස්තාන මිලිටරිය ලාල් මස්ජිඩය (රතු පල්ලිය) තුලට කඩා වැදීම ආරක්ෂා කල අතර “අන්තවාදී ලෙස යොදා ගැනෙන” ඕනෑම මඩරසාවකට (ඉස්ලාමීය පාසැල්) එරෙහිව මිලිටරිය යොදවන බවට තර්ජනය කරමින් වයඹ දිග පෙරමුනු පලාත (නෝත් වෙස්ට් ෆ්‍රන්ටියර් ප්‍රොවින්ස්) තුල අතිරේක මිලිටරි හා පොලිස් හමුදා තර කරන බවට පොරොන්දු විය.

ඉස්ලාමාබාද් නගර මධ්‍යයෙහි තිබෙන පල්ලි-පාසැල් සංකීර්නයක් වන ලාල් මස්ජිඩයට කඩා වැදුනු මිලිටරිය බලය තහවුරු කර ගැනීම සඳහා බදාදා සවස් යාමය තෙක් කල පැය 36ක සටනේදී මියගිය විශාල සංඛ්‍යාව පිලිබඳව ජනරාල්වරයා සාවද්‍ය ලෙස කනගාටුව පල කලේය. “අවාසනාවන්ත ලෙස අපට අපගේම ජනතාවට විරුද්ධව නැගී සිටීමට සිදුවිය...ඔවුන් නියම මාර්ගයෙන් ඉවත ගොස් ත්‍රස්තවාදයට නැඹුරු වීයැ” යි මුෂාරෆ් පැවසීය.

මුෂාරෆ් නොකිවූ බොහෝ දේ අතර තිබූ කරුනු නම් ලාල් මස්ජිඩය තුල මිලිටරියේ වටලෑම සාමකාමී ලෙස අවසන් කිරීම සඳහා සඳුදා රාත්‍රියේ ඔහු ඝාතන නොකරන බවට පුද්ගලිකවම ගිවිස ගත් බව හා මෙම පල්ලිය හා එහි නායකයින් බොහෝ කලක සිට පකිස්තාන මිලිටරි - රහස්‍ය තොරතුරු අංශය සමග නොයෙකුත් ඉස්ලාමීය සන්නද්ධ කන්ඩායම් සම්බන්ධ කරන හුයක කොටසක් ලෙස පැවති බවයි.

යථාර්තය නම් මුෂාරෆ් හා ඔහුගේ මිලිටරිය ඝාතනය සිදු කල බවයි. පකිස්තානයේ බොහෝ සුපිරි කන්ඩායම්ද සහිතව දොලොස් දහසක් හමුදා භටයන් අධික ජන සංකේන්ද්‍රනයක් සහිත ඉස්ලාමාබාද් නගර මධ්‍යයෙහි ඔවුන් විසින් යොදවනු ලැබීය. ගැහැනු හා ලමයින්ද ඇතුලු සිය ගනනක් නිරායුධ ජනයා ඇතුලේ සිටින බව දැන සිටියද කාලතුවක්කු ප්‍රහාරයන්ද සමගින් පහර දීමට අනතුරුව අන කෙරිනි.

මෙම ලේ හැලීමෙන් මුෂාරෆ් එල්ලයන් දෙකක් මුදුන් පමුනුවා ගැනීමට බලාපොරොත්තු වෙයි. එකක් නම් රට තුල ගෝත්‍රික හා පශ්තූන සුලුතර ජනයා සතුරු කර ගැනීමේ වියදමින් වුව පකිස්තානයේ තලිබාන්-හිතවාදී කොටස් වලට එරෙහිව මිලිටරි ක්‍රියා උත්සන්න කල යුතු යැයි බල කරන බුෂ් පරිපාලනය සතුටු කිරීමය. දෙවැන්න නම් ජනාධිපති ලෙස ඔහුගේ “යලි ඡන්දයෙන් පත්වීමේ” රංගන තැනට එරෙහිව නැගී එන විරෝධය වෙනතක යොමු කිරීම හා එය සමග ගනු දෙනු කිරීමේ විධික්‍රම වැඩි කර ගැනීමය.

මාස දෙකකටත් අඩු කලකට පෙරාතුව “සේවය අත් හිටුවන ලද” ශ්‍රේෂ්ඨාධිකරන අග විනිසුරු ඉෆ්තිකාර් චව්දරී පිලි ගැනීමට එක් රොක් වුනු ජනයාට ආරක්ෂක හමුදාවන්ගේ අනුබලය සහිතව මුෂාරෆ්ට සහය දෙන එම්කිව්එම් විසින් පහර දෙනු ලැබ හතලිහකට වැඩිපිරිසක් ඝාතනය කරනු ලැබිනි.

පල්ලිය අල්ලා ගත් බවට මිලිටරිය විසින් නිවේදනය කරනු ලැබ දින දෙකකට ආසන්න කලක් ගත වුවද ලාල් මස්ජිඩ් සංකීර්නය අල්ලා ගැනීමේදී කොපමන ඝාතනය වීද යන්න තවමත් පිලිතුරු නොමැති ප්‍රශ්නයකි.

මල සිරුරු 75 ක් හමුවූ බව කියන පකිස්තාන බලධාරීහු මිලිටරි මරන දහයද ඇතුලුව දින අටෙහි වැටලීමේ කාලය තුල මරන සංඛ්‍යාව 108 ක් බව කියා සිටිති. එම 108න් 85ක්ම මරනයට පත් වූයේ අඟහරුවාදා හා බදාදා ලාල් මස්ජිඩයට කඩා වැදීමේදී බව සම්මත වී ඇත.

එනමුදු යථා මරන සංඛ්‍යාව මීට බොහෝ වැඩි විය හැක. බ්‍රහස්පතින්දා හමුදා අත්පත් කර ගැනීමෙන් මොහොතකට පසු ලාල් මස්ජිඩයට හා ඊට අනුබද්ධ ජමීයා හෆ්සා කාන්තා පූජක පුහුනු ස්ථානයට ගිය නිර්නාමික පුද්ගලයකු කියා සිටියේ සුදු රෙදි වලින් එතූ මල සිරුරු වලින් මහල් පිරී ඉතිරී ගොස් තිබූ බවය.” මට ඒ සියල්ල ගනන් කිරීමට නොහැකි වුවත් සිය ගනනක් සිරුරු තිබෙන්නට ඇතැ” යි ඔහු පැවසූ බව ඩෝන් පුවත්පත වාර්තා කලේය.

"සමහර සිදුවීම් හෙලි වීමට තුඩු දෙන්නාවූ සලකුනු අකා මකා දැමීමට අවශ්‍ය කාලය ලබා ගැනීමේ අරමුනින්, මාධ්‍යයන් හට එම ස්ථානයට යාමට ඉඩ ලබා දෙන බවට වූ පොරොන්දුව කල් දැමූ බවට සැක පැතිරෙන්නේ යැ" යිද ඩෝන් නිරීක්ෂනය කලේය.

පල්ලිය අත් පත් කර ගැනීමේ මෙහෙයුම් මිලිටරිය විසින් දියත් කරනු ලැබීමෙන් අනතුරුව සමීපතම රෝහල් තුනට පිවිසීම වාර්තාකරුවන්ට තහනම් කිරීම මගින් මරන හා තුවාල කරුවන් සංඛ්‍යාව ගනන් බැලීම වැලැක්විය.

ගැටුම් අවසන් වී පැය කිහිපයකට පසුව ගැහැනු හා ලමයින් නොමැරුනු බව එසේ නැත්නම් එම මරන ප්‍රමානය අතිශයින්ම අවම බව ආන්ඩුව හා මිලිටරිය අවධාරනය කලේය. සිරුරු 19ක් පමන අතිශයින් කැබලිවී ඇති බැවින් ලිංගිකත්වය හෝ වයස සොයා ගත නොහැකි බව ඔව්හු පසුව පිලිගත්හ.

සිය ගනනක් පමන විය හැකි ජනයා නොසන්සුන් ලෙස සොයන්නා වූ තම නෑදෑයන්ගෙන් බොහොමයක් ලාල් මස්ජිඩය සමග සම්බන්ධිත විද්‍යාල දෙකින් එකකට ඇතුලත් කර තිබූ දැනට අතුරුදහන්ව සිටින යොවුන් පිරිමි හා ගැහැනු ලමයින් වීම ආන්ඩුවේ ප්‍රකාශයන් ගේ සාවද්‍යතාව ගෙනහැර දක්වයි.

මරනයට පත්වූ හෝ තුවාල ලැබූ සංඛ්‍යාව පිලිබඳව පවතින පුලුල් සැකය පිලිගනිමින් තොරතුරු පිලිබඳ ඇමති මොහොමඩ් අලි දුරානි බ්‍රහස්පතින්දා අවධාරනය කර සිටියේ" කිසිම සැගවීමක් නොමැත. අප සගවන්නේ කුමටද" යනුවෙනි.

බ්‍රහස්පතින්දා සවස පල්ලි සංකීර්නයට පැමිනි වාර්තාකරුවෝ, එතැන මූනිස්සම් කා වැදුනු ලේ පැල්ලම් සහිත සමහර තැනෙක පුපුරා හැලුනු බිත්ති සහිත යුද්ධ පිටියක් ලෙස විස්තර කලහ. මිලිටරි ප්‍රකාශකයන් කියා සිටි යේ මෙමගින් ඔවුන් මුහුන දුන් බරපතල ප්‍රතිරෝධය පිලිබඳ සාක්ෂි ලැබෙන බවයි.

ප්‍රහාරය පිලිබඳ ආන්ඩුවේ මූලික යුක්ති සහගත කිරීම වූයේ සංකීර්නය තුල "විදේශික යුධකාමීන්" සිටින බවට පැවති පිලිගැනීමය. ලාල් මස්ජිඩය මෙහෙය වූ දෙබෑයන් අතුරින් බාලයා වූ අබ්දුල් රෂීඩ් ගාසි මෙම කතාව සම්පූර්නයෙන්ම ප්‍රතික්ෂේප කලේය. පල්ලියට එල්ල කල ප්‍රහාරයේදී ඝාතනය කෙරුනු ගාසි, පල්ලිය වට කිරීමෙන් දෙවන දිනයේ සිය වැඩිමහල් සහෝදරයා අත් අඩංගුවට පත්වීමෙන් පසු පල්ලිය තුල යුධකාමීන්ගේ නායකයා බවට පත්විය.

මුෂාරෆ් බ්‍රහස්පතින්දා ජාතිය අමතා කල සිය කතාව තුල ලාල් මස්ජිඩයේ විදේශික සටන්කරුවන් සැගවී සිටි බවට යලි චෝදනා කල නමුත් එය ඔප්පු කිරීමට සාධක ඉදිරිපත් කලේ නැත.

එල්ල විය හැකි ප්‍රති ප්‍රහාරයක් පිලිබඳව ආරක්ෂක හමුදා රට පුරා අතිශය සීරුවෙන් තබන ලදී. බ්‍රහස්පතින්දා වයඹ දිග පෙරමුනු පලාත (නෝත් වෙස්ට් ෆ්‍රන්ටියර් ප්‍රොවින්ස්) තුල පොලිසියේ තුන් දෙනෙකුද ඇතුලු පස් දෙනෙකු මරා ගෙන මැරෙන බෝම්බයකින් ඝාතනය කෙරුනු අතර පකිස්තානයේ ගෝත්‍රික තීරයේ කොටසක් වන උතුරු වසිරිස්තානයේ දී දෙවන මරාගෙන මැරෙන බෝම්බයෙන් ආන්ඩුවේ සේවකයන් දෙදෙනෙකු ඝාතනය විය.

ඉස්ලාමීය පක්ෂ හයක එකමුතුවෙන් තැනුනු එම් එම් ඒ විසින් ගොඩ නැගුනු වයඹ දිග පෙරමුනු පලාත් ආන්ඩුව ලාල් මස්ජිඩය වටලෑම හා කඩා වැදීම තුල දී ඝාතනය කෙරුනු සියල්ලන් සැමරීම සඳහා දින තුනක නිල ශෝක කාලයක් ප්‍රකාශයට පත් කලේය. අගහරුවාදා සිටම වයඹ දිග පෙරමුනු පලාතේ නගර තුල මුෂාරෆ් ඇමරිකානු රූකඩයක් ලෙස හෙලා දකින උද්ඝෝෂන පැවැත්විනි.

ඇෆ්ගනිස්තානයේ හා ඉරාකයේ ඇමරිකාව විසින් කර ගෙන යනු ලබන වර්තමාන ආක්‍රමනික යුද්ධ නිසාත් පකිස්තානයේ ඒකාධිපති මිලිටරි පාලකයන්ට සහයෝගය දීමේ දීර්ඝ ඉතිහාසය නිසාත් ඇමරිකානු ආන්ඩුවට එරෙහි විරුද්ධත්වය පකිස්තානයේ පලාත් සිසාරා ප්‍රාදේශික වශයෙන් මෙන්ම වැඩිපුරවම සමාජමය වශයෙන්ද පවතියි. ඇෆ්ගනිස්තානය සමග ප්‍රබල වාර්ගික හා සංස්කෘතික බැඳීම් පවතින පස්තුන ජනතාව බහුතරයක් වෙසෙන වයඹ දිග පෙරමුනු පලාත තුල එය සුවිශේෂ ලෙසම ශක්තිමත්ය.

## එ. ජ. සමූලඝාතනය වර්නනා කරයි

මේ අතර පකිස්ථාන ආන්ඩුව ලාල් මස්ජිඩ් සටන්කාමීන් සාහසික ලෙස මර්ධනය කිරීම බුෂ් පරිපාලනය විසින් ඉතා ඉහලින් වර්නනා කරනු ලැබ ඇත. පසුගිය අඟහරුවාදා හමුදා මෙහෙයුම් උපරිමයෙන් ක්‍රියාත්මක වන විට, ඒකාධිපති මුෂාරෆ් සහ පකිස්ථානයේ ප්‍රජාතන්ත්‍රවාදය ගොඩනැංවීම සඳහා වූ ඔහුගේ උත්සාහය අගයමින්, මම ඔහුට කැමතියි මම ඔහුව අගය කරනවා යැයි බුෂ් පැවසීය.

පකිස්ථානය තුල තලෙයිබාන් කැරැල්ල සඳහා වන ආධාර මර්ධනය කිරීම වෙනුවෙන් ප්‍රමානවත් ක්‍රියාමාර්ග නොගැනීම සම්බන්ධයෙන් මීට පෙර මුෂාරෆ් පාලනය විවේචනය කල නිව්යෝක් ටයිම්ස් වැනි විවිධ ලිබරල්

මාධ්‍ය මුෂාරෆ්ගේ ලාල් මස්ජිඩයට එරෙහි හමුදා මෙහෙයුම පිලිගෙන ඇත.

වාමාංශිකයින්ට සහ කම්කරු පන්තියට එරෙහිව, ඉස්ලාමීය මූලධර්මවාදය පවුරක් ලෙස යොදාගැනීම සඳහා හා එ. ජ. සීතල යුධ අරමුනු වල චිරස්ථිතිය උදෙසා ඉස්ලාමීය සන්නද්ධ කන්ඩායම් සමග සම්බන්ධතා ගොඩනැංවීමෙහි ලා පකිස්තානු මිලිටරිය හා දේශපාලන ප්‍රභූන් දිරිගැන්වීමට එ. ජ. ප්‍රධාන භූමිකාවක් රඟ දැක්වීය. පසුකාලීනව, ඉස්ලමාබාදය මෙම සම්බන්ධතා ඇෆ්ඝනිස්ථානයේ කාෂ්මීරයේ සහ ඉන්දියාවේ තම භූ-දේහපාලනික අභිලාෂයන් සඳහා යොදා ගැනිනි.

ඉස්ලාමීයකරනය තම මූලික ප්‍රතිපත්තිය කරගත් ජෙනරාල් ෂියා, 1977 වසරේදී රාජ්‍ය බලය පැහැරගැනීමට කල කුමන්ත්‍රනය සඳහා එ. ජ. කොල එලිය දැල් වූවේය. ඒ සමගම ෂියාගේ පාලන තන්ත්‍රය ඇෆ්ඝනිස්ථානයේ මුජහදීන්වරුන්ට සී.අයි.ඒ. සංවිධානයේ හා සවුදියේ ආධාර ගලායන ප්‍රධාන සැපයුම් මාර්ගය විය.

සීතල යුධ සමය නිමවීමත් සමගම එ.ජ. තම ප්‍රමුඛතතාවයන් වෙනස් කලද, පකිස්ථානු හමුදා බුද්ධි අංශ යාන්ත්‍රනය විවිධ ඉස්ලාමීය සටන්කාමී සංවිධාන සමග ඔවුන් පැවැත්වූ සම්බන්ධතා තවදුරටත් පෝෂනය කිරීමත් පුලුල් කිරීමත් නොකඩවා සිදු කරන ලදී.

ඉස්ලමාබාද් නගර මධ්‍යයේ පකිස්ථානු රහස් පොලිස් මුලස්ථාන ගොඩනැගිල්ල (අන්තර් සේවා රහස් තොරතුරු ඒජන්සිය) ඇතුළු රජයේ ගොඩනැගිලි ගනනාවකට ආසන්නයේ පිහිටා ඇති ලාල් මස්ජිඩ් මුස්ලිම් පල්ලිය මේ සම්බන්ධ වැදගත් පාර්ශවයක් බවට පත්විය. අබ්දුල් රෂිඩ් ඝාසිගේ පියාවන මව්ලානා අබ්දුල්ලා ජෙනරාල් ෂියා සමග සමීප සම්බන්ධකම් පැවැත්වූ බවට සැලකෙන අතර දිගු කාලයක් පුරා ලාල් මස්ජිඩ් සඳහා නායකත්වය සැපයීය. එමෙන්ම ඝාසි සහ ඔහුගේ සොහොයුරා පකිස්ථානු මිලිටරි ආරක්ෂක අංශ සමග සම්බන්ධතා තිබූ බවටද සැලකේ.

වසර 1999 දී බලය අත්පත් කරගැනීමෙන් පසු ඉස්ලාමීය කන්ඩායම් සමග මිලිටරි ආරක්ෂක අංශ පැවැත් වූ සම්බන්ධතා ආපසු හරවන ආකාරයේ දැඩි වෙනස්කම් රාශියක් කිරීමට එ.ජ. බලපෑම් යටතේ මුෂාරෆ්ට බලකෙරින. වඩා නාටකාකාර ලෙස වසර 2001 සැප්තැම්බරයේදී පකිස්ථානය යලි ගල් යුගයට වැටෙන ලෙස බෝම්බ දමා විනාශ කරනවාය යන එ.ජ. තර්ජනයට ප්‍රතිචාර වශයෙන් ඉස්ලමාබාදය එවකට තලේබාන්වරුන්ට ලබා දුන් සහයෝගය ඉවත් කොට ගෙන ඇෆ්ඝනිස්ථානය යටත් කරගැනීමේ මෙහෙයුම් ක්‍රියාත්මක කරන කරලිය බවට පකිස්තානය පත් කිරීමට එ.ජ.ට ඉඩ දෙන බවට මුෂාරෆ් එකග විය.

නමුත් කාෂ්මීරයේ පවතින ඉන්දියානු විරෝධී කැරලි සඳහා පකිස්ථානය ලබාදෙන සහය කප්පාදු කරන ලෙසද වොෂින්ටනය ඉස්ලාමාබාදයට බලපෑම් කරන ලදී.

විශේෂිතවම, එ.ජ.ය විසින් ස්ථාපිත ඇෆ්ඝනිස්ථාන ආන්ඩුව තුල පෂ්තුන්වරුන් අප්‍රධානව සැලකීමත්, කාෂ්මීරය සම්බන්ධව කිසියම් අර්ථාන්විත සහනයක් සඳහා ඉන්දියාව පොලඹවා ගැනීමට වොෂින්ටනය අසාර්ථක වීමත්, පකිස්ථාන සංස්ථාපිතය තුල මෙම පියවරවල් විරෝධතාවලට හේතුවිය.

මුෂාරෆ්ගේ රජය සමග ලාල් මස්ජිඩ් ඉස්ලාම්වාදීන් ගැටුමකට ගියේ කෙසේදැයි හා ඇයිදැයි යන සම්පූර්න කථාව තවමත් පවසා නැත. වයඹ දිග පෙරමුනු පලාතේ හා ගෝත්‍රික ප්‍රදේශවල තලේබාන්වාදී කල්ලිවලට සහයෝගය ප්‍රකාශ කිරීම, අතුරුදහන්වන්නන්ගේ ගනන් ඉහලයාම සම්බන්ධව අවධානය යොමුකිරීම, ෂාරියා නීතිය සඳහා වන ව්‍යාපාරයේ කොටසක් ලෙස පොලිස් සහ චීන ජාතිකයන් පැහැරගෙන යාම, වැනි ඔවුන්ගේ සමහර ක්‍රියාමාර්ග පැහැදිලිවම ආන්ඩුවේ වැඩපිලිවෙලට බාධා කලේය.

ලාල් මස්ජිඩ් හා ඉස්ලාමාබාද්හි වෙනත් මුස්ලිම් දේවස්ථාන නීති විරෝධීව ඉදිකර ඇතැයි රාජ්‍ය බලධරය චෝදනා කල නිසා වාසිදායක දේපල ප්‍රශ්නයට බඳුන් විය.

සෙමනේරි විද්‍යාල දෙකෙහිම සිසුන්ගෙන් වැඩි කොටසක් ලාල් මස්ජිඩ් සමග සම්බන්ධතා පවත්වන අතර, මොවුන්ගෙන් බොහෝදෙනෙක් ෂාරියා නීතියට සහාය දක්වමින් ඉස්ලාමාබාදයේදී සන්නද්ධ උද්ඝෝෂන වලට සහභාගි වූවෝය. මොවුහු පකිස්ථානයේ වඩාත්ම දිලිඳු ප්‍රදේශවලින් පැමින ඇති බවත්, ඊටම එක් කල යුතුය. ඉස්ලාම් පාසල් ව්‍යාප්ත වූයේ හුදෙක් ෂියාගේ ඒකාධිපති පාලන කාලයේ පටන් ඔවුන් බුක්ති විඳි දේශපාලන සහයෝගය නිසාම නොවේ. එය පකිස්ථානය තුලම පවතින කාලකන්නි දුගීබවේත් මහජන අධ්‍යාපනයේ ඛේදජනක තත්වයේත් නිෂ්පාදනයකි.

ආන්ඩුවේ නීත්‍යානුකූලභාවයට අභියෝග කරමින්, මාස ගනනාවක් පුරා ගෙනගිය ක්‍රියාමාර්ග නොසලකා හරිමින්, පකිස්ථාන අධිකාරිය ලාල් මස්ජිඩ්හි අරගලයට වර්ධනය වන්නට ඉඩහල බවට බොහෝ සාක්ෂි පෙන්නුම් කරන බව පැවසේ. බොහෝ නිරීක්ෂකයින් පෙන්නා දෙන්නේ, තම සුඛෝපභෝගී නිල කාමර ඇවිදගෙන යන දුරින් පිහිටා ඇති අයිඑස්අයි හි උසස් නිලධාරින් හට නොදැනී ලාල් මස්ජිඩය තුලට හොර රහසේ ආයුධ සහ පතරොම් විශාල ප්‍රමානයක් ගෙනයෑම ගැන සිතීම පවා හාස්‍යජනක බවයි.

අගනගරය තුල සිදුවන ඉස්ලාමීය කැරැල්ල මුෂාරෆ්ගේ රජය දුටුවේ, අඩුම තරමින් මිලිටරි පාලනයට එරෙහි වන ප්‍රජාතන්ත්‍රවාදී විරුද්ධ පක්ෂය සහ කම්කරු පන්තිය පාගා දැමීමට ආධාරකයක් ලෙසටය.

ලාල් මස්ජිඩ්හි කලහකාරී තත්වයට ඉඩදී, එය ඉවසාගෙන සිටි මුෂාරෆ්, තම ඒකාධිපතිවාදය චිරස්ථායී කරගැනීමේ මාර්ගයක් හා පකිස්ථානය තුල තලෙයිබාන්වරුන්ට ඇති සහාය විනාශකිරීමට තමා තුල තිබෙන අධිෂ්ඨානය වොෂින්ටනයට පෙන්නුම් කල හැකි මාර්ගයක් ලෙස දැකීමෙන් පසු, ඉතා නින්දාශීලී ලෙස හා කෲර ලෙස ලාල් මස්ජිඩ් භූමිකාවට එරෙහිව ක්‍රියාමාර්ග ගන්නා ලදී.

බෙනාසීර් භූතෝ සහ ඇගේ පකිස්ථානු මහජන පක්ෂය (පීපීපී) සමග බලය බෙදා ගැනීමේ ගනුදෙනුවක් තැරැව් කරගැනීමේ උත්සාහයක කොටසක් හැටියට, ජෙනරාල්වරයා තමා " අනාගාමික" හා "උතුම් වූ" ඉස්ලාම් දහම වෙනුවෙන් කතාකරන්නෙක් ලෙස හුවාදැක්වීමට උත්සාහ කරයි. මේ වෙනුවෙන්, භූතෝ නැවත නැවතත් පෙන්නුම් කර ඇත්තේ නිල බලය බෙදා ගැනීමේ සෑහීමකට පත්විය හැකි ක්‍රමයක් සකස්කරගත හැකි නම්, ඉස්ලාමීය අයිතීන්ට විරුද්ධ වීමේ නාමයෙන්, තමන් ජෙනරාල්වරයා සමග සන්ධාන ගතවීමට සූදානම් බවයි.

භූතෝගේ පීපීපී පක්ෂය ලාල් මස්ජිඩයට එරෙහි හමුදා ක්‍රියාමාර්ග පිලිගෙන ඇති අතර නවාස් ෂරීෆ්ගේ පීඑම්එල්එන් හා එම්එම්ඒ ඇතුළු අනෙකුත් විපක්ෂ සමග සංධානගතවීම ප්‍රතික්ෂේප කර ඇත. මෑතකදී බුෂ් පරිපාලනය සමග සිය සම්බන්ධකම් වගාකරගත් පීපීපී පක්ෂය, සර්වපාක්ෂික ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරය විසින් ලබන මස කැඳවා ඇති මුෂාරෆ් විරෝධී රැලිය සම්බන්ධයෙන් ප්‍රකාශ කර ඇත්තේ, මෙය මහජන උද්ඝෝෂන සඳහා අනුකූල නොවන කාලයක් බවයි.

පීපීපී සමග ගිවිසුමකට එළඹීමට නොහැකි බව ඔප්පු වුවහොත් ඉස්ලාමීය "අන්තවාදීන්" සමග ඇති ඝට්ටනය හේතුවක් ලෙස දක්වමින් හදිසි නීතිය පනවා, එමගින් ඉදිරියේ පවත්වන්නට ඔහු පොරොන්දු වී ඇති මැතිවරනය නවතා දැමීමේ විකල්පය මුෂාරෆ් සතුය.

© www.wsws.org